# පුස්තකාල ප්‍රවෘත්ති

කලාප 7 අංක 1 - 4

1979

ජාතික පුස්තකාලය

# පුස්තකාල ප්‍රවෘත්ති

1979

පටුන


| | | |
|---|---|---|
| * | පුස්තකාල සහකාරවරුන් පුහුණු කිරීම පිළිබඳ පොදු රාජ්‍ය මණ්ඩලීය සම්මන්ත්‍රණය | 1 - 13 |
| * | ශ්‍රී ලංකා ජාතික මහා පුස්තකාලය : ප්‍රභවය, ව්‍යුහය සහ සේවා | 31 - 53 |

---

ළමා පුස්තකාල අතිරේකය :

| | | |
|---|---|---|
| * | ළමා පුස්තකාල සංවිධානය | 17 - 23 |
| * | "බත්කෝ" හෙවත් ජපන් රටේ ළමා පුස්තකාල | 25 - 29 |


---


ශ්‍රී ලංකා
ජාතික … ල සේවා මණ්ඩලයේ
… ගාරයයි.



7 වන කලාපය - අංක : 1 සිට 4



ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

# පුස්තකාල ප්‍රවෘත්ති

## ත්‍රෛමාසික ප්‍රකාශනය

සංස්කාරක:

එච්. අමරසිංහ

සහාය සංස්කාරක:

පියසේන වික්‍රමගේ

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
තුන්වන මහල, මාලිගාවත්ත මහ ලේකම් කාර්යාලය
කොළඹ-10. ටෙලි: 31332

මෙහි පළ වන අදහස් අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අදහස් නොවන අතර, ඒ පිළිබඳ වගකීම අදාල ලේඛකයන් වෙත පැවරේ.


සියළුම ලිපි හා විමසීම්:

ජාතික පුස්තකාල සේවා අධ්‍යක්‍ෂ
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
තුන්වන මහල, මාලිගාවත්ත මහ ලේකම් කාර්යාලය
කොළඹ-10. ටැලි: 31332.

# පුස්තකාල ප්‍රවෘත්ති සඟරාව

1900 වර්ෂයේ පටන්

# ජාතික පුස්තකාල සඟරාව

නමින් පළවේ

පුස්තකාල ක්ෂේත්‍රය අළලා ලියැවුන ලිපි
පළ කිරීම සඳහා සුදුසුදැයි සලකා බැලීම පිණිස
පහත ලිපිනයට යොමු කරන්න.
අදාල ක්ෂේත්‍රයට අයත් පොතපතද
විචාරය සඳහා එවිය හැක.

ලිපිනය:
ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂ,
ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
3වන මහල, මාලිගාවත්ත මහලේකම් කාර්යාලය
කොළඹ 10 - ටැලි: 31332

# පුස්තකාල සහකාරවරුන් පුහුණු කිරීම පිළිබඳ

## පොදු රාජ්‍ය මණ්ඩල සම්මන්ත්‍රණය

(ෆීජි - 1979 සැප්තැම්බර් 24 - ඔක්තෝබර් 05)

පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් රටවල පුස්තකාල සහකාරවරුන් පුහුණු කිරීම සම්බන්ධයෙන් සම්මන්ත්‍රණයක් 1979 සැප්තැම්බර් මස 24 වන දින සිට ඔක්තෝබර් මස 05 වන දින දක්වා ෆීජි දිවයින්වල අගනුවර වන සුවා නගරයෙහිදී පැවැත්විණ.

පොදු රාජ්‍ය මණ්ඩලීය පුස්තකාල සංගමයේ මෙහෙයවීමෙන් පවත්වන ලද මෙම සම්මන්ත්‍රණයට ආසියාව, අප්‍රිකාව හා යුරෝපීය රටවලින් ජ්‍යෙෂ්ඨ පුස්තකාල නිලධාරීන් සහභාගි විය. යුනෙස්කෝ සංවිධානයේ ආධාර ඇතිව පවත්වන ලද මෙම සමුළුවට ශ්‍රී ලංකාවේ නියෝජිතවරයා වශයෙන් ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂවරයා සහභාගි විය.

පුස්තකාල පාලනයේදී, පුස්තකාල සහකාරවරුන්ගේ සේවය ගැන අගැයීමක් කරන ලදුව, බොහෝ රටවල මෙම ශ්‍රේණියේ සේවක මණ්ඩලය පුහුණු කිරීම සඳහා ක්‍රමවත් පාඨ මාලාවක් පිළියෙල වී නොමැති බව හෙළි විය. දැනට පවත්වාගෙන යන බොහෝ පාඨ මාලාවන්හි අඩංගු කරුණු මෙම ශ්‍රේණිවල කාර්යයන්ට අදාල නොවන අතර වෘත්තීයමය කාර්ය මණ්ඩලයේ කාර්යයන්ට නැඹුරු බව තහවුරු විය. මේ නිසා මෙම පාඨ මාලා හැදෑරීමෙන් පසුව වුවද, පුස්තකාල සහකාරවරුන්ට අදාල කාර්යයන්හි කාර්යක්ෂමව කටයුතු කිරීමට නොහැකි වී ඇති බව පිළි ගන්නා ලදී.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඉහළ මට්ටමේ පුස්තකාලයාධිපතිවරුන්ට තිරතුරුව පුස්තකාල සහකාරවරුන් මෙහෙයවීමට සිදුවී ඇති බවත්, ඒ හේතුවෙන් වෘත්තීය කටයුතු කෙරෙහි යොමු කළ හැකි කාලය සීමා වී ඇති බවත් අනාවරණය විය. විශේෂයෙන් පුහුණු පුස්තකාලයාධිපතිවරයෙක් නොමැති පුස්තකාලවල දෛනික ..යයන්හි ව්‍යාකූල තත්ත්වයක් ඇතිවීමද මීට හේතු වී ඇති බව පැහැදිලි විය.

මෙම තත්ත්වය මඟ හරවා ගැනීම සඳහා පුස්තකාල සහකාරවරුන්ගේ එදිනෙදා කාර්යයන්ට අදාල පාඨ මාලාවක් සකස් කිරීමේ වැදගත්කම නියෝජිත-යින් විසින් පිළිගන්නා ලදී. දැනටමත් ඔස්ට්‍රේලියාව හා බ්‍රිතාන්‍යය යන රටවල මෙවැනි පාඨ මාලා සාර්ථකව පවත්වාගෙන යන බව සඳහන් වින. එවැනි පාඨ මාලාවන් සෙසු රටවලද ආරම්භ කිරීමේ අවශ්‍යතාවය ඒකමතිකව පිළි ගන්නා ලදී.

මේ අනුව, ඒ ඒ රටවලින් පැමිණි පුස්තකාල නියෝජිතවරු විසින් එක් එක් විෂයයක් ඉගැන්වීම පිළිබඳ යෝජනා කෙටුම්පත් සම්මන්ත්‍රණයට ඉදිරිපත් කරන ලදී. මෙම කෙටුම්පත් අවශ්‍ය සංශෝධනයන්ට භාජන කිරීමෙන් පසුව පොදු රාජ්‍ය මණ්ඩල පුස්තකාල සංගමයට ඉදිරිපත් කරන ලදුව, අනුමත කරන ලදී. අනුමත කරන ලද විෂය මාලාවන් මුද්‍රණය කර සාමාජික රටවල පුස්තකාල විද්‍යා පාසල්වල භාවිතය සඳහා බෙදා හැරීමට තීරණය කරන ලදී.

ශ්‍රී ලංකාවෙන් ඉදිරිපත් කරන ලද්දේ <u>ජාතික සාහිත්‍යයකට අදාල පුස්තකාල කාර්ය</u> නමැති විෂය ඉගැන්වීම පිළිබඳ යෝජනාවකි. පොදු රාජ්‍ය මණ්ඩල පුස්තකාල සංගමය විසින් පිළිගත් එම විෂය මාලාව පරිශිෂ්ටයක් වශයෙන් මෙහි පහත දැක්වේ.

## National literature and its bibliography

AIM: To introduce the student to the national literature its availability and bibliography. (Note: in this module national literature means published and unpublished information sources)

OBJECTIVES: On the completion of this module the students should be able to:

(1) List and use standard reference works on the country and have a knowledge of their content.

(2) List and use bibliographies, printed catalogues and guides to materials, published in the country and/or of special relevance to the country.

(3) Identify and describe the special features of collections of national literature.

(4) Describe the special features and librarianship of a regional literature and its bibliography and perform clerical duties associated with 'Regional cooperation'.

(5) Identify authors of the country and their works.

(6) Identify sources of book production and distribution in and on the country.

(7) Identify sources of production of materials for specific groups.

(8) Assist in the exploitation and promotion of the national literature, recording of oral tradition and in the compilation of bibliographies.

Objective (1) - List and use standard reference works on the country and have a knowledge of their content.

Course content: Examine the following types of reference works in regard to 'scope', 'bias', 'reliability', 'up-to-dateness' and 'autoritativeness'.

(a) Encyclopaedias, Dictionaries
(b) Directories, Yearbooks
(c) Gazetters, maps and atlases
(d) Biographical dictionaries, Who's Who

Teaching method: i. Lectures

ii. Practical work in the use and assesement of works

iii. Discussion

Teaching materials: Handout listing the material to be examined and the criteria of assessing

Time: 4 hours of lectures

8 hours of practical work

Evaluation: Evaluation of practical work

Objective (2) List and use bibliographies, printed catalogues and guides to materials published in the country and/or of special relevance to the country.

Course content: Examine bibliographies, printed catalogues, guides to literature, indexes, abstracts, in regard to 'scope','coverage', 'abstracts', 'accuracy', form (systematic/descriptive) up-to-dateness.

Teaching method: i. Lectures

ii. Practical work

iii. Discussion

Teaching materials: Handouts listing materials to be examined. Samples

Time: 2 hours of lectures

4 hours of practical work

Evaluation: Evaluation of practical work

Objective (3): Identify and describe the special features of and criteria for assessing collections of the National literature.

Course content:

1. Legal deposit/copyright laws
2. Collections in National, Academic, Public, Private and institutional libraries (esp. British Library, Library of Congress, SOAS, Commonwealth Library), including government publications and archive materials. Library catalogues, Union catalogues, Accession lists (esp. BM Catalogue, LC Accession lists)
3. Regional collections in overseas libraries Cooperative schemes

4. Interlibrary loans (national and international)
5. Reprography services
6. Exchange of publications

Teaching method: Lectures & practical work

Teaching materials: Samples of catalogues, bibliographies etc. (note: It is unlikely that suitable teaching materials will be readily available. The primary sources themselves will be found scattered if available at all. Teachers ought to collect as much primary sources as possible or prepare their own guides by collecting necessary information).

Time: 12 hours of lectures
8 hours of practical training

Evaluation: Quizzes, short answer questions

Objective (4) <u>Describe special features and librarianship of a regional literature and its bibliography and perform clerical duties associated with 'Regional Cooperation'.</u>

Course content: Meaning of regional cooperation, its aims and objectives.

Library networks their projects and acquisition policies, procedures, collections, bibliographic materials produced, their contents, inter-library loans, reprographic services, exchange of publications, data bases, exchange of information.

Teaching method: Lectures, Seminars, Essays and practical work in routine procedures

Teaching materials: Handouts

Sample forms

Examples of letters in routine correspondence

Time: 6 hours (3 hours of lectures & 3 hours of practical work)

Evaluation: Evaluation of practical work

Objective (5) <u>Identify authors of the country and their works</u> (Note: Author means any person or body responsible for the creation of the intelectual and artistic content of an item)

Course content: (a) Overview of the major authors and their works relevant to the country

(b) Contemporary authors and their works relevant to the country

(c) Sources of oral tradition

Teaching method: Lectures

Interviews

Assigned reading

Discussions

Teaching materials: Handout listing authors

Tapes, films, slides

Time: 6 hours (Lecture and discussion)

Evaluation: Credit on practical work

Tests and quizzes

Objective (6) <u>Identify sources of book production and distribution in and on the country</u>

Course content: Introduce the student to the sources of book production:

(i) Government printing and publishing (central Government as well as individual departments with an overview of the structure and functions of the State Machinery.

(ii) Private/Commercial printing and publishing industry.

(iii) Subject specialisation (Fiction, science, children's literature, audio-visual materials etc.)

(iv) Author/Publishers

(v) Copyright, Legal deposit vis-a-vis printing and publishing

(vi) State censorship

(vii) Methods of production (Letterpress, monotype, duplicating, offset etc.)

(viii) Liason with the publishing trade

| | |
|---|---|
| Teaching method: | Lectures |
| | Visits to printing/publishing houses, book shops |
| | Discussions |
| Teaching materials: | Lists of Printers/Publishers/Book-sellers |
| | Examples of different methods of printing & production |
| | Publishers lists, Brochures |
| Time: | 2 hours (excluding visits) |
| Evaluation: | Evaluation of practical work |
| | Quizzes |
| | Short answer questions |

Objective (7) **Identify sources of production of materials for specific groups of readers**

Course content: Practical survey of resources available for children, new readers, minority language groups, interest groups etc. in the country: Authors and writers and their works, Printers, publishers and book sellers (Govt. and non-governmental), dealers in audio-visual materials. adult education projects, book clubs, agencies of international organisations promoting such activities.

Teaching method: Lectures
Discussions
Practical work

Teaching materials: Sample materials
Catalogues
Bibliographies

Time: 2hours (lectures)
4hours (practical work)

Objective (8) Assist in the exploiting and promotion of the national literature, in the recording of oral tradition and in the compilation of bibliographies.

Course content: Methods of literature search
Method of interviewing and recording
Use of catalogue, bibliographies, guides
Reference processes
Communication
Simple cataloguing, elements of bibliography form and style of entries, alphabetisation, proof reading, typing

Teaching method: Lectures
Demonstration
Practical work

Teaching materials: Samples of bibliographies, catalogues, and recording equipment

Time: 3 hours of lectures
6 hours of practical work

Evaluation: Evaluation of practical work

## ප්‍ර කා ශ න

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින්
ප්‍රකාශිත පොත පත...

* <u>මහජන පුස්තකාල ප්‍රමිති</u>

  සංස්කරණය:

  ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

  මිල රු: 4.00

* <u>ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය</u>

  වාර්ෂික දායක මුදල රු: 45.00(තැ.ගා.සමග)

* <u>මහජන පුස්තකාල තොරතුරු සංග්‍රහය - 1978</u>

  මිල රු: 10.00

* <u>පුස්තකාල ප්‍රවෘත්ති</u>

  සිංහල - දෙමළ - ඉංග්‍රීසි භාෂා ත්‍රයෙන්
  ත්‍රෛමාසික ප්‍රකාශනය - නොමිළයේ සැපයේ

* Catalogue of Postgraduate
  Dissertations in the Libraries
  of Sri Lanka - /2nd ed. in press/

  Comp. by N. Amarasinghe
  (Unpriced)


ලියුම්, මුදල් අණවුම් හෝ චෙක්පත් පහත ලිපිනයට:
අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
තුන්වන මහල, මාලිගාවත්ත මහලේකම් කාර්යාලය,
කොළඹ - 10.

ටැලි: 31332.

# පුස්තකාල ප්‍රවෘත්ති

## ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රවෘත්ති පත්‍රය

දිවයින පුරා පුස්තකාල තොරතුරු ත්‍රෛමාසිකව ගෙනඑයි

පුස්තකාල සේවා පිළිබඳ සියළුම තොරතුරු හා වාර්තා පහත ලිපිනයට යොමු කරන්න:

ජාතික පුස්තකාල සේවා අධ්‍යක්‍ෂ,
ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
3වන මහල, මාලිගාවත්ත මහ ලේකම් කාර්යාලය
කොළඹ - 10 ; ටැලි: 31332

# ළමා පුස්තකාල සංවිධානය

එච්. අමරසිංහ
විසිනි.

ළමා පුස්තකාල සංවිධානය ගැන කතා කිරීමට පෙරව පොදුවේ පුස්තකාල ගැන වචනයක් මතක් කළ යුතුය. ලංකාවේ පුස්තකාල ගොඩ නැඟීම පිළිබඳ මෑත සිට සෑහෙන උනන්දුවක් ඇත. එහෙත් පුස්තකාල ගැන මහජනයා තුල ඇති වැටහීම එතරම්ම නිරවද්‍ය යැයි මට හිතන්නට බැහැ. මීට හේතුවී ඇත්තේ පුස්තකාල සේවය කුමක්ද යන්න හඳුනා ගැනීමටවත් සෑසෙන කාර්යක්‍ෂම පුස්තකාල සේවයක් මේ රටේ තවමත් නොතිබීමයි. එම නිසා මෙම වැටහීම මහජනයා තුල ඇති කිරීම ඔබටත් මටත් ඇති පළමුවන කාර්යයයි. මේ ගැන මහජනයාට කරුණු කියා දීමෙන් ප්‍රයෝජනයක් නැත. අප විසින් කළ යුත්තේ ක්‍රියාවෙන් පෙන්වීමයි. ඒ මඟට ඔබ යොමු කිරීම සඳහා කරුණු කීපයක් ගැන ඔබේ අවධාරනය මා වෙත යොමු කරන මෙන් ඉල්ලනවා! "Libraries are the temples of tomorrow" "පුස්තකාල අනාගත පූජනීය ස්ථානයයි" එක් බටහිර ලේඛකයෙක් සඳහන් කරලා තයෙනවා. අතීතයේදී මිනිසාට බුද්ධි වර්ධනය සඳහා හෝ සමාජ සංවර්ධනය සඳහා හෝ මඟ පෙන්වූයේ පන්සල පල්ලිය හෝ දේවස්ථානය මෙන්ම අනාගතයේ ඒ කාර්යය පුස්තකාලයෙන් සිදුවේය කියන එකයි ඒකෙ තේරුම.

## යල් පිනූ අදහස්

පුස්තකාලය පොත් ගබඩා කර තබන තැනක්ය කියන අදහස අද යල් පැනපු කතාවක්. පුස්තකාලය උගත් අයගේ ප්‍රයෝජනය සඳහා ඇති ආයතනයක්ය යන අදහසත් ඒ වගේම යල් පැනපු අදහසක්. නූතනයේ පුස්තකාලය හඳුන්වන්නේ අධ්‍යාපනික ආයතනයක් හැටියට. මනුෂ්‍යයා උපන් දා සිට මැරෙන තුරු ඉගෙන ගන්නා සත්වයෙක් යන මූලික සිද්ධාන්තය මතයි, අද පුස්තකාල සංවිධානය සිදුවන්නේ. එනකොට පුස්තකාලවලින් ලැබිය හැකි දැනුමේ හෝ අධ්‍යාපනයේ සීමාවක් නැ. සීමාවක් ඇතොත් ඒ ඇත්තේ එක් එක් වර්ගවල පුස්තකාලවලයි. නමුත් සංස්ථාවක් වශයෙන් පුස්තකාලය මනුෂ්‍යයා ලබා ඇති සියළුම ඥානය ආරක්ෂා කොට බෙදා හරින මධ්‍යස්ථානය වශයෙනුයි අප සැලකිය යුත්තේ. අප පුස්තකාලයක් ආරම්භ කරනවා යන්නෙන් අදහස් කරන්නේ අර කී සංස්ථාවේ අවයවයක් ඇති කිරීම පමණයි.

මේ නිසා රටක පුස්තකාල සේවය ඒකාබද්ධ සේවයක් ලෙස සැලකිය යුතුයි. එවැනි ඒකාබද්ධ සේවයක් ඇති කිරීම සඳහා යම් කිසි සැලසුම් කිරීමක් අවශ්‍යයි. පුස්තකාල වර්ග හා අන්‍යොන්‍ය පුස්තකාල අතර සහයෝගිතාවය ඇති වන පරිදි එම සැලසුම පිළියෙල විය යුතුයි. ළමා පුස්තකාලත්, ඒ නිසා ජාතික පුස්තකාල සේවයක එක අවයවයක් පමණයි.

## පුහුණුව

මිළඟට මේ සෑම අවයවයකට සාධාරන කරුණක් ගැන සඳහන් කිරීම අවශ්‍යයි. එනම් මෙම සේවය පවත්වාගෙන යෑමට අවශ්‍ය සේවක පිරිස පුහුණු

කිරීමයි. පුස්තකාල විද්‍යා අධ්‍යාපනය යනුවෙන් අප හඳුන්වන්නේ එයයි. මෙම සේවක පිරිස පුහුණු කිරීමේදී නොයෙක් නොයෙක් පුස්තකාල වර්ගවලට — එනම් ළමා පුස්තකාල, පාසල් පුස්තකාල, විශ්ව විද්‍යාල පුස්තකාල, මහජන පුස්තකාල, කාර්මික හා විද්‍යාත්මක පර්යේෂණ පුස්තකාල, ජාතික පුස්තකාල යනාදී නානා පුස්තකාලවල සේවාවන්ට අනුකූල වනසේ විශේෂයෙන් පුහුණු කිරීම අවශ්‍යයි. එසේ අවශ්‍යවන්නේ එක් එක් පුස්තකාලවල සේවය රඳා පවත්නේ ඒ ඒ පුස්තකාලවල පාඨකයින්ගේ ස්වභාවය, මානසික තත්ත්වය, අවශ්‍යතා යනාදිය එකිනෙකට වෙනස් නිසා ඒ ඒ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි පුහුණුවක් අවශ්‍ය නිසාත්ය. යටත් පිරිසෙයින් අවුරුද්දක කාලයක පුහුණුවක් ආරම්භයේදී අවශ්‍ය වෙනවා. එසේ පුහුණුව නොලබා පුස්තකාල සේවයක් පවත්වා ගෙන යාමට උත්සාහ කිරීම "කණා බල්ලන්ට ගහන්නා වගේ" කලාතුරකින් හරියන්ට පුළුවන් වැඩක්. නමුත් ළමයින් එවැනි අත්හදා බැලීම් වලට පාත්‍ර කළ හැකි පිරිසක් නොවේ. ආරම්භයේදී ම කුමානුකූලව ඔවුන්ට පුස්තකාලය හඳුන්වා නුදුන්නොත් ඔහුන් පුස්තකාලයත් සඳහම්ම වෙනස් වී පවතිනවා වැළැක්වීම අපහසු ය.

## ළමා මනස තේරුම් ගැනීම

නූතන පුස්තකාල සේවයේ ප්‍රධාන කාර්‍යයී හඳුන්වනවා 'පාඨක සේවා' යනුවෙන්. එයින් අදහස් කරන්නේ පුස්තකාලය පරිහරණය කරන අයට අවශ්‍ය දැනුම ලබා ගැනීම පිළිබඳ උපදෙස් දීමයි. වයසින් මුහුකුරා ගිය අය සඳහා පාඨක සේවා සැලසීමේදී ගැටළු මතුවන්නේ ඔවුන්ට අවශ්‍ය දේ පුස්තකාලයේ ඇත්ද, නැත්ද එසේ නැතහොත් එය ලබාගන්නේ කෙසේද යනාදිය පිළිබඳවයි. එහෙත් කුඩා ළමයින්ට සලසන පුස්තකාලයක සේවක මණ්ඩලයට හෝ පුස්තකාලයාධිපතිට ඇති වන ප්‍රධාන

ගැටළුව වන්නේ ළමා මනස තේරුම් ගැනීමයි. ළමයින්ට සුදුසු පොත් පත් මොනවාද, ඒ කෙරෙහි ඔවුන් යොමු කළ යුත්තේ කෙසේද? ඊට හේතුවූ බාහිර අභ්‍යන්තර හේතු මොනවාද? මේවා සෑම ළමා පුස්තකාලයාධිපති කෙනෙකුත් විසින්ම ප්‍රත්‍යක්ෂව අවබෝධ කරගත යුතු ප්‍රශ්නයන් කිපයක්ය.

පොදු වශයෙන් එක් වයස් සීමාවකට අයත් ළමුන් ක්‍රියා කරන්නේ එක් ආකාරයකට නමුත් එකම වයස් සීමාවකට අයත් ළමුන් සමූහයකගේ දක්ෂතාවයන්, ප්‍රතික්‍රියා, යනාදිය බෙහෙවින් එකිනෙකාට වෙනස් විය හැකිය. තම පුස්තකාලයට පැමිණෙන ළමුන් සියළු දෙනා පිළිබඳ මෙවැනි මනෝ විද්‍යාත්මක වැටහීමක් නැති පුස්තකාලයාධිපතිට ඒ ළමුන් උදෙසා කළ හැකි පාඨක සේවාව ඉතාම අල්පය. මේ නිසා ළමා පුස්තකාල හා පාසල් පුස්තකාල සඳහා පුස්තකාලයාධිපතිවරුන් පුහුණු කිරීමේදී මනෝ විද්‍යාව, පාඨක රුචිය යනාදිය උගැන්වීම අවශ්‍යව තිබේ.

ගැටළු
====

විශේෂයෙන් අප රටේ ගම්බද පෙදෙස්වල ළමා පුස්තකාල සේවයක් ඇති කිරීමේදී මීට වඩා වෙනස් ගැටළු වලට ද පුස්තකාලයාධිපති කෙනෙකුට මුහුණපෑමට සිදුවේ. නගර බද මෙන් නොව පාසල් යාමට පෙර කුඩා ළමයින්ට ලැබිය හැකි ක්‍රමවත් ළදරු අධ්‍යාපනයක් නැත්නම් ප්‍රාග් පාසල් අධ්‍යාපනයක් (මොන්ටිසෝරි යනුවෙන් සාමාන්‍යයෙන් හඳුන්වන්නේ එයයි) ගම්බද නැත. ගම්බද බොහෝ පාසල්වල මූලික අධ්‍යාපනය ලබන ළදරුවන්ට, මූලික අධ්‍යාපනය පිළිබඳ පුහුණුවක් ලැබූ ගුරුවරුන්ගේ සේවයද ලැබෙන්නේ ඉතාමත් කලාතුරකිනි. පාසැලේදී නොලැබෙන

පරිසරය ගෙදරදී ලැබීමට තරම් සුදුසු වාතාවරණයක්ද බොහෝ ගම්බද පෙදෙස්වල හිඟය. එම නිසා මේ අඩුපාඩු ඉටුවන අත්දැමීත් ක්‍රියා කිරීමේ වගකීමද පුස්තකාලයාධිපති පිට පැවරෙන බව අප විසින් ඒත්තු ගත යුතුය.

ළමා පුස්තකාල දියුණු රටවල, ළමයින් පුස්තකාලයට පැමිණෙන්නේ ගෙදර සිටීමට වඩා ප්‍රීතියෙනි. ඒ පුස්තකාලයාධිපතිවරු ළමයින්ට දෙමව්පියන් මෙන්ද, ගුරුවරුන් මෙන්ද, යහළුවන් මෙන්ද හැසිරෙන හැටි මම දැක තිබේ. ඔවුන් එම පුස්තකාල වලින් අධ්‍යාපනය ලබන්නේ නිරායාසයෙනි. ඔවුන් ලබන එම අධ්‍යාපනය සංවර්ධන අධ්‍යාපනයකි. පාසලේ දී හෝ ගෙදරදී නොලබන පුළුල් අධ්‍යාපන පරිසරයක් එහි ඇත.

අප රටේ ගම්බද ළමා පුස්තකාලයාධිපති කෙනෙකුට මුහුණ පෑමට ඇති තවත් ප්‍රශ්නයක් නම් කිසිම අධ්‍යාපනයක් නොලබන ළමුන්ටද පුස්තකාල සේවයක් ලබා දීමයි. මෙහිදී ඔහුට/ඇයට අකුරු උගැන්වීමේ කාර්‍යයටත් අතගැසීමට සිදුවේ.

දියුණු බොහෝ රටවල අවුරුදු 5 – 15ත් අතර වයස් සීමාවේ ළමුන් සඳහා සේවය කරන පුස්තකාලයාධිපතිවරු, ගුරු පුස්තකාලයාධිපතිවරුන් (Teacher = Librarians ) වශයෙන් හඳුන්වන්නේ. ඉගැන්වීම හා පුස්තකාල පාඨක සේවා සම්බන්ධය ළමුන් පුස්තකාලවලට හුරු පුරුදු කිරීමේ ඉතාම සාර්ථක ක්‍රමයයි.

## අධ්‍යාපනික ද්‍රව්‍ය

මීළඟට ළමා පුස්තකාලයක අවශ්‍ය පොත්පත් හා වෙනත් අධ්‍යාපනික ද්‍රව්‍යයන් පිළිබඳ වචනයක් සඳහන් කළ යුතුයි. නූතන අධ්‍යාපන ක්‍රමයේ, දැනුම ලබා ගැනීමේ මාධ්‍යය පොත් පත්වලට පමණක් සීමා වී නැත. ගුවන් විදුලිය, ග්‍රැමපෝන් රෙකෝඩ්

හා ශබ්ද පටි, චිත්‍රපටි, දේශන, කථාන්තර කීම, සමූහ ගායනා, අධ්‍යාපනික චාරිකා යනාදිය බහුල වශයෙන් අධ්‍යාපනික කටයුතු සඳහා යොදා ගෙන ඇත. ඇතැම් විට මේ මාධ්‍යයන් ඇතැම් විෂයයන් සඳහා පොතපතට වඩා පහසුවුත්, ජනප්‍රිය වූත්, ප්‍රබලවූත් මාධ්‍යයන් බව ඔප්පු වී තිබේ. පුස්තකාල සේවයේදීද මෙම මාධ්‍යයන් බහුලව යොදා ගන්නා බව අප විසින් අමතක නොකළ යුතුව ඇත.

අවාසනාවකට මෙන්, අප රටේ පුස්තකාලය හඳුන්වන්නේ පොත් පමණක් ඇති කියවීම් ශාලාවකටය. ඇතැම් විට එහි ඇති පොත් පවා සාමාන්‍යයෙන් පාසලේදී කියවන පොත් පත්වල එකතුවකි. එවැනි පොත්ගුල විවිධත්වයෙන් තොර පාඨක රුචියට අහිතකර ස්ථානයකි. අතිරේක කියවීම් පොත්, පින්තූර පොත් හා වෙනත් මාධ්‍යයන් ගෙන් දැනුම විවිධාකාරව ඉදිරිපත් කිරීමේ පහසුව පුස්තකාලයක් සතුව තිබිය යුතුය.

බොහෝ අපරදිග රටවල ළමා පුස්තකාල පමණක් නොව වැඩිමහල්ලන් සඳහා ඇති මහජන පුස්තකාල පවා මේ විවිධ මාධ්‍යයන් ඇසුරු කොට ඔවුන්ගේ සේවා පවත්වාගෙන යන බව සඳහන් කළ යුතුය. තේ පැන් ශාලා, පිහිනුම් තටාක, විනෝදාංශ, චිත්‍රපටි, ප්‍රදර්ශන ශාලා යනාදිය ඒවායේ බොහෝ විට දක්නට ඇත. මේ අතින් අප රට ළමා පුස්තකාලයක් ආරම්භ කිරීමේදී ඇති පහසුකම් ඉතාමත් මඳ බව කිව යුත්තක්ද නොවේ. එහෙත්, ක්‍රියා ශීලී පුස්තකාලයාධිපති කෙනෙකුට සෑහෙන ළමා පුස්තකාලයක් ගොඩ නඟා ගැනීමට නොහැකි නොවේ.

අප රටේ සෑහෙන ප්‍රමාණයක ළමා සාහිත්‍යයක් දැනටමත් ඇත. ළමා චිත්‍රපට, රෙකෝඩ් යනාදි විවිධ මාධ්‍යයන් යුනෙස්කෝ ළමා අරමුදල, තානාපති කාර්යාල සේවා, මඟින් ලබාගත හැකිය. ළමා පුස්තකාලයකට ළමයින් පැමිණීමට

මන්දෝත්සාහී වුවහොත් එහ ළමයින්ගේ වරද නොව පුස්තකාලයේ වරද බව පුස්තකාලයාධිපති නිතරම සිහිපත් කරන්නේ නම් ළමා පුස්තකාල ගොඩ නැඟීම අසීරු කරුණක් නොවේ.

## ගෞරවය

මා මේ සඳහන් කළේ ළමා පුස්තකාලයක් ගොඩ නැඟීමේදී අත්‍යවශ්‍ය අංග දෙකකි. මේස, පුටු, පොත්, රාක්ක, සූචි අනවශ්‍ය දේ නොවේ. ඒවා සැලසුම් කිරීම ගැනද හොඳ අවබෝධයක් පුස්තකාලයාධිපතිවරයෙකුට තිබිය යුතුය. මෙම අංග පිළිබඳ උපදෙස් ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන් ලබා ගත හැකිය. නමුත් මා කලින් සඳහන් කළාක් මෙන් පොත් රාක්ක, පොත් සහ මේස-පුටුවලින් පුස්තකාලයක් බිහි කළ නොහැකිය. ඒවා මහා සේවයට උපකාරී වන මෙවලම්ය. සේවය රඳා පවතින්නේ පුස්තකාලයාධිපතිගේ සේවා ඥානය කොතෙක්ද එපමණටය. පුස්තකාල සේවා ඥානය ලබා ගැනීම සඳහා පුස්තකාල විද්‍යා පාඨමාලාවක් අනුගමනය කිරීම ඉතාම අවශ්‍ය බව නැවතත් අවධාරණයෙන් සඳහන් කළ යුතුය.

පුස්තකාලයාධිපතින් වශයෙන්, අවසාන වශයෙන් වචනයක් මතක් කළ යුතුය. ප්‍රඥාවන්ත මිනිසෙකු බිහි කිරීම තරම් උත්කෘෂ්ඨ සේවයක් ලෝකයේ නැත. කිසිම රජයේ සේවාවක් අධ්‍යාපනය තරම් මිනිසාගේ ජීවිත කාලයට බලපාන්නේ නැත. සියළුම ආගම්වල මූලික ඉගැන්වීම මිනිසා ප්‍රඥාවෙන් යහ මඟට හැරවීමයි. එම වගකීම නූතන පුස්තකාලයාධිපති පිට අනවරතයෙන් පැවරී තිබෙන බව මෙනෙහි කළ යුතුයි. ජාතියක් ගොඩ නැඟීමේ මුල් පියවර ඔබ විසින් ගත යුතුය. ඒ සඳහා ලැබෙන මහඟු ආයෘදය ප්‍රාඥයින්ගේ අපරිමිත ගෞරවයයි.

(සර්වෝදය ළමා පුස්තකාලයාධිපතිවරුන් අමතා කළ කථාවක සාරාංශය)

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය
සඳහා පොත් රැස් කිරීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා පොත් එකතු කිරීම ආරම්භ කළ බව සතුටින් නිවේදනය කරනු ලැබේ.

තෑගි වශයෙන් හෝ වෙනත් අයුරකින් ලංකාවේ භාෂා, ශාස්ත්‍ර, විද්‍යා, ඉතිහාස යනාදි විෂයයන්ට අදාළ පොත් පත් ලබා ගැනීමට ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට උපකාරී වන ලෙස ශාස්ත්‍රාභිලාෂී සියලු දෙනාගෙන් ම කරුණාවෙන් ඉල්ලා සිටිමි.

සභාපති,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

තුන්වන මහල,
මාලිගාවත්ත මහලේකම් කාර්යාලය,
කොළඹ - 10.

දුරකථන අංකය : 36035
31332

## ජනතාව හා පොතපත ඒකරාශි කිරීම

"බන්කෝ" සෙවීම

## ජපන් රටේ ළමා පුස්තකාල

### තෝකියෝ ළමා පුස්තකාලයේ අධ්‍යක්ෂක කියෝතෝ මත්සුවෝකා විසිනි

"බන්කෝ" යන ජපන් වචනයෙහි අරුත වූ කලී "සාහිත්‍ය කෘතිවලින් පිරි ගබඩාව" යන්නයි. යම් කිසිවෙක් සතු පුද්ගලික පොත්පත් එකතුවක් සඳහා එය නිතරම භාවිතා වේ. එම වදනම අද දිනයෙහි ළමයින් අතරද භාවිතා වන්නේ ඊට වෙනස් අරුතකිනි. එය අද "ළමා පුස්තකාලය" යන අදහසද ඟවන්නකි. රජයේ නොවන විවිධ කණ්ඩායම් හා පුද්ගලයන් විසින් මේවා සංවිධානය කර තිබේ. අවාසනාවකට මෙන්, ජපන් රටේ මහජන පුස්තකාල හොඳින් සංවිධානය හා සංවර්ධනය වී නොමැත්තේය. ළමයින්ගේ කියවීම් ක්ෂේත්‍රය විෂයෙහි මෙම කුඩා පුද්ගලික පුස්තකාල ක්‍රමය වැදගත් වූ කාර්ය භාරයක් ඉටුකිරීමට සමත්ව ඇත්තේය. එය මුළු රට තුළම ළමයින් හා පොතපත විෂයෙහි මුළුමනින්ම පාහේ සැලකිය යුතු උද්‍යෝගීමත් භාවයක් ඇති කිරීමෙහි සමත්වෙමින් සිටී.

"බන්කෝ" පුද්ගලයින්ගේ ගෙවල සංස්ථාපනය වී ඇත. බොහෝ විට ගෘහණියෝ පොතපතින් ලබන ආශ්වාදය සෙසු අසල්වාසීන්ගේ ළමුන් හා බෙදා හදා ගනු රිසියෙන් එම ළමුනට තම නිවසට පැමිණෙන සේ ආරාධනා කරති. සාමාන්‍යයෙන් සතියකට වරක් සන්ධ්‍යා භාගයේ මෙම ඇරයුම කෙරෙයි. ඇය තමා සතු ළමා පොත් පත් එකතුව ඔවුනගේ පරිහරණය සඳහා නිකුත් කරන්නීය. ඇතැම් විට ළමුනට ඒවා

ගෙදර ගෙන ගොස් කියවීමට ලබා දීම පිණිස ප්‍රථම පියවරයි; වෙනත් විදිහකට කිවොත්, එය තමාට සැලසුන කියවීම් ආස්වාදය සෙස්සන් හා බෙදා හදා ගැනීමයි.

## කතෙයි බත්කෝ

පුද්ගලිකව පවත්වාගෙන යනු ලබන මෙවන් "කතෙයි බත්කෝ" යනුවෙන් ජපන් බසින් ව්‍යවහාර කරයි. එය "ගෙදරක පුස්තකාලය" යන අරුත ගඟවයි. මෙම ක්‍රමය ජපන් රටේ භාවිතයට පැමිණ දැනට වසර 20 ක් පමණ වෙතැයි දැක්වේ. ළමයින්ගේ කියවීම පිළිබඳ උනන්දුවක් දැක්වූ වැඩිහිටියනගේ අවධානය මෙම කරුණ කෙරෙහි වහා යොමුවිණි. ක්‍රම ක්‍රමයෙන් ස්වේච්ඡාවෙන් ම ජනයා තම අසල්වාසීන් උදෙසා මෙවන් පුස්තකාල සංවිධානයට උත්සුක වූහ.

ළමා පොතපත සම්පාදනය කළ ලේඛකයෝ තිරාසයෙන්ම තමන් සතුව තිබූ විශාල ළමා පොත් එකතුවලින් ළමුන් සඳහා කියවීම පිණිස පොතපත ප්‍රදානය පටන් ගති. ළමයින්ගේ පොතපත පිළිබඳ ප්‍රතික්‍රියා කවරාකාරදැයි දැනගැනීමේ ප්‍රථම තිවැරදි මූලාශ්‍රයක් වශයෙන් ඔවුනට ඉතාම වැදගත් සාධක සපයන්නෙක් විය.

වයස්ගත ගෘහනියක් තම දරු දැරියන් වැඩිවිය පැමිනීමත් සමඟ හුදෙකලාව ගිය ළමා පොතපත හා තම මහලු වියෙහි ගෙවෙන විවේක කාලය මෙම ළමා පුස්තකාල සංකල්ප හා වහා එක්ව ගත්තෝය. එය මෙම වයස්ගත කතුනට යමක නිරතවීමේ අවස්ථාව සලසා දුනි. එය සමාජයේ වෙසෙන සෙස්සන්ට මෙහෙයක් කිරීමේ තෘප්තිය ලබා දුනි. විශේෂයෙන් ඉන් වැඩෙන ළමුනට සෙතක් අත් විය.

මේ අතරතුර තරුණ ගෘහපතිනියන්ට ද තමන්ගේ වැඩෙන දූ දරුවන් විෂයෙහි පැන නැග තිබුණාවූ හදිසි අවශ්‍යතාවක් වූ කියවීම සඳහා වඩාත් යෝග්‍ය ද්‍රව්‍ය සෙවිල්ල ඔස්සේ මෙම "බත්කෝ" පුස්තකාල සංකල්ප වෙත ඇදී ආයේ නිරායාසයෙනි.

මෙම තරුණ මව්වරු පිරිස එක්වගෙන කණ්ඩායමක් ද පිහිටුවා ගත්තෝය. ඔවුන් සැවොම කුඩා මුදල් සම්මාදමක් මගින් එකතු කර ගත් මුදලින් එක්ව, තම ළමුන් සැමගේ පරිහරණය සඳහා පොත් මිල දී ගැනීමට ද සමත් වූහ. එය සමූපකාර පදනමකින් යුතුව, දරු දැරියනට උචිතා හොඳ පොතපත මිල දී ගැනීමෙහි මඟතු ප්‍රයත්නයක් විය. රජයේ නිවාස යෝජනා ක්‍රමයක මෙවන් කණ්ඩායමක් එක් වූ කල්හි, නිදසුනක් වශයෙන් මෙසේ සම්මාදම් කර ගත් අරමුදල පුද්ගලික නිවාසයක තැන්පත් කරනු වෙනුවට, එය ප්‍රජා මණ්ඩල කාර්‍යාලයේ තැන්පත් කිරීමෙන් පුස්තකාලයට වඩා මහජන ආයතනයක ස්වරූපය දීමෙහි උපස්ථම්භක වූවා සේ විය.

## චික්කි බත්කෝ

පුද්ගලික නිවාසයක පිහිටුවා තිබුණ වූ ද, පාලනය පැහැදිලි වශයෙන්ම පුද්ගලික මට්ටමකින් නොපැවතියා වූ ද, පුස්තකාලය "චික්කි බත්කෝ" නොහොත් ප්‍රජා පුස්තකාලයක් ලෙසින් හඳුන්වන්නට වයදිණ. එසේ වුවත්, එම පුස්තකාලය තම අවශ්‍යතා පිළිබඳ සවිඥානකත්වයකින් යුතු වූ පුද්ගලයින් විසින් මුදල් හදල් යොදන ලද්දා සේම, ස්වේච්ඡාවෙන් ඔවුන් විසින් පාලනය කරන ලද්දේ ද විය.

ඉක්මණින්ම ප්‍රාථමික සහ පූර්ව පාසල් මගින් මේ ආකාරයේ පුස්තකාල සංවර්ධනය පටන් ගන්නා ලදී. මේවා "එන් බත්කෝ" නොහොත් ප්‍රාථමික පුස්තකාල වශයෙන් හඳුන්වන ලදී. බෞද්ධ පන්සල් ආරාම, ක්‍රිස්තියානි පල්ලිද මෙම ව්‍යාපාරයට අනතුරුව එක්විණ. ඉරිදා ඉස්කෝලවලට පැමිණි ළමුන් සඳහා තමන්ගේම පුස්තකාල ඔවුන් විසින් අරඹන ලදී.

මෙසේ රට පුරාම "බන්කෝ" පුස්තකාල ක්‍රමය ගැන මෙන්ම, ළමයින්ගේ කියවීමේ රුචිය පිළිබඳව ද උනන්දුවක් වර්ධනය වූයේය. මෙහි ප්‍රතිඵලය වූයේ මහජන පුස්තකාල දියුණුවද වේගවත් වීමයි. නව මහජන පුස්තකාල ළමා සේවාවන් පිළිබඳ එල්ලය ඇතිව පුද්ගලික නොවන, පොදු අභිප්‍රායක් ඇතිව එවැනි පොතපත සඳහා මුදල් ප්‍රතිපාදන ඇති කල්හි, මව්වරුනට "බන්කෝ" පුස්තකාලයක් ආරම්භ කිරීමට ධෛර්යය දෙනවාත් හැර, ඔවුනට උවමනා පොතපත සපයා දීමටද පොරොන්දු වීමද සිදුවේ. මෙසේ මහජනාධාර වලින් යැපෙන, එහෙත් පුද්ගලිකව පවත්වා ගෙන යන එවැනි පුස්තකාල මහජන පුස්තකාල සේවා ඒකක වශයෙන් වර්ධනය කෙරේ. ඇත්ත වශයෙන් එවැනි මව්වරුන්ගේ උද්‍යෝගිමත් ව්‍යාපාර නිසාම තම ජන කොට්ඨාශයට ශාඛා පුස්තකාලයක් ලබා ගැනීමෙහි සමත් අවස්ථා ද දක්නට ලැබේ.

## පුස්තකාල 4000 ක්

දැනට රට පුරාම මෙවැනි විවිධ "බන්කෝ" පුස්තකාල 4000ක් පමණ ඇතැයි පැවසේ. එය ප්‍රමාණුකූලව කොතරම්දැයි කිවහොත්, ළමයින්ට මහජන පුස්තකාල මගින් පිරිනමන සේවාවන් මෙන් හත් ගුණයක් පමණ වෙතැයි මෙහි ලා සඳහන් කිරීම වටනේය.

ජපානයෙන් පරිබාහිර ලෝකයේ බොහෝ ජනයා ද ළමයින් සඳහා වන මෙවන් පුද්ගලික කුඩා පුස්තකාල සංකල්ප කෙරේ බෙහෙවින් සිත් ඇඳී ගොස් ඇති බව පෙනී යයි. ස්වභාවයෙන්ම මහජන පුස්තකාල සේවා සංවර්ධනය කිරීමට ඇති රටවල ජනයාට වඩාත්ම අදාලත්වයකින් යුතු වූවකි, මෙම සංකල්පය. ඒක්තිසාද යත්, ඔවුන්ගේ පුරෝගාමීත්වයෙන්ම ඇරඹිය හැකි නිසාමය. එපමණක්ද නොව, එය ළමයින් මෙන්ම, වැඩිහිටියන් උදෙසා ද දියුණු කළ හැකි ප්‍රබෝධනයක් පමණක් නොව, කියවීමට පෙළඹවීමට හා හොඳ පොත පතෙහි අවශ්‍යතාවත්, ළමයින් වෙනුවෙන් කැප වූ පුස්තකාල සේවාවක් පිළිබඳ අත්‍යාවශ්‍ය භාවයත් අවබෝධ කිරීමෙහි සමත් වන්නකි.

ජපානයේ මෙවන් පුද්ගලික පුස්තකාල, ළමයින්ගේ පොතපත පිළිබඳව උද්ගතව ඇති විවිධ ගැටළු විෂයෙහි අවසාන විසඳුමක් නොවතුදු, මෙම "බන්කෝ" පුස්තකාල සංකල්පය සමහරක් රටවල ට තදින් ම ගලපා ගත හැකි බව පෙනේ. එය ළමයින්ගේ පොතපත හා ඔවුනට ම කැප වූ පුස්තකාල සේවාවක වැඩි දියුණුව සඳහා තබන පළමු පියවරක් වශයෙන් දැක්විය හැක.

පරිවර්තනය : පියසේන වික්‍රමගේ

අර්ථ නිරූපණය :

ජාතික පුස්තකාලය පිළිබඳව නිර්වචනයක් කරන්නේ නම්, එය මෙසේය: රටක පූර්ණ ලිඛිත සාහිත්‍යය ත්‍රෛකාලික වශයෙන් සුරැකිව තබන, එය ජාතියේ අවශ්‍යතාවන් සඳහා පරිහරණයට ඉඩ සලසන, ග්‍රන්ථ විද්‍යාත්මක සේවාවන් මාර්ගයෙන් ජාතියේ අධ්‍යාපනික හා වෙනත් ශාස්ත්‍රීය කාර්යයන් සඳහා මග පෙන්වන සංස්කෘතික නිකේතනයකි.

ජාතික පුස්තකාලය පිළිබඳ සංකල්පය ලොව පුරා වැඩි වර්ධනය වීමත් සමගම අද එය ජාතික තොරතුරු සැපයීමේ මධ්‍යස්ථානයක් ලෙසද පිළිගැනේ. ජාතික පුස්තකාලයේ තැන්පත් වන පොතපත මුද්‍රිත හෝ අමුද්‍රිත විය හැකිය. පැරණි මෙන්ම නූතනද විය හැකිය. ජාතියක් වශයෙන් ලාංකිකයන් විසින් මේ මිහිපිට ජීවත් වන තාක් කල් ලියැවෙන ලිඛිත සාහිත්‍යය මෙහි තැන්පත් වනු ඇත.

මෙසේ ජාතික වශයෙන් ලියැවෙන පොතපත ආරක්ෂා කිරීමේ වැදගත්කම මැනවින් පසක් වන්නේ එකී පොතපත ලබා ගැනීමට නොහැකි වන අවස්ථාවලය.

මෙරට ලියැවුණු මුද්‍රිත හෝ අමුද්‍රිත සෑම පොතපතක්ම ඓතිහාසික අතින් වැදගත් ලියකියවිල්ලක්ම මෙරට ආරක්ෂා වී ඇතැයි අපට සතුටට පත්විය නොහැකිය. එහෙත් අඩුපාඩු සහිත වුවත්, ජාතික කෞතුකාගාර පුස්තකාලයේ හා රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ පොත්පත් හා ඓතිහාසික අතින් වටිනා ලියකියවිලි සම්භාරයක් එක්රැස්වී තිබේ. විශේෂයෙන්ම පැරණි පොත්පත් රාශියක් මේවායේ ආරක්ෂා කරගෙන ඇත.

ශ්‍රී ලංකා ජාතික මහා පුස්තකාලය

ප්‍රභවය, ව්‍යුහය සහ සේවා

---

වයි. හැරිසන් ද සිල්වා
විසිනි

පුස්තකාලය පිළිබඳව කතා කරන විට එහි අර්ථය පැහැදිලි කිරීමට අනවශ්‍ය තරම් ලෙස එය ජන ජීවිතයට මුල් බැසගෙන තිබේ. මහජන, පාසල්, විශ්ව විද්‍යාල, පිරිවෙන් හා විශේෂ ආදී වශයෙන් පුස්තකාල වර්ග කිහිපයකි. මෙම පුස්තකාල නාමයන් ජන සමාජයේ බෙහෙවින් ප්‍රචලිතය. මෙරටට අළුත් දෙයක් ලෙසය, ජාතික පුස්තකාලය හඳුන්වා දීමට සිදුවන්නේ.

ජාතික පුස්තකාලයක් සෑම රටක තිබිය යුත්තකි. පිහිටපිය යුත්තකි. ජාතික පුස්තකාලය පිහිටුවා පවත්වාගෙන යාම ඕනෑම ජාතියක වගකීමකි. වෙනත් ඕනෑම වර්ගයක පුස්තකාල රාශියක් තිබිය හැකි වුවත්, ජාතික පුස්තකාල ඕනෑම රටක තිබෙන්නේ එකකි.

ජාතික පුස්තකාලය, ජාතිය සතු වූ සංස්කෘතික කෝෂ්ඨාගාරයක් වශයෙන් හැඳින්වීම නිවැරදිය. මෙය රජයේ මහා පුස්තකාලය ලෙස ඒ ඒ රාජ්‍යයන් විසින් මෙහෙයවනු ලබන්නේය.

අධිරාජ්‍යවාදීන්ගේ පාලනයට මෙරට නතුව පැවති කාලයේ ලියවුණු වටිනා පොත්පත් හා වටිනා ලේඛන රාශියක් අපට අහිමිව තිබීම කණගාටුවට කරුණකි. විවිධ විෂයයන් යටතේ ලියැවුණු පොත් රාශියක් මේවා අතර වේ. මෙරට ලියැවුණු අධිරාජ්‍යවාදී පාලකයින් විසින් ගෙන ගොස් තිබෙන වටිනා පොත් හා ඓතිහාසික ලේඛන රාශියක් දැනට මහා බ්‍රිතාන්‍යයේ කෞතුකාගාර පුස්තකාලයේත්, ඕලන්ද ජාතික පුස්තකාලයේත්, පෘතුගාලයේ ජාතික පුස්තකාලයේත් දක්නට ඇත්තේය. දැනට මේවා අපට නොලැබී යන තත්වයකි උදාව පවතින්නේ. මේවා ලබා ගැනීමට සකස් වූ වැඩ පිළිවෙලක්ද නොමැත. අඩුම වශයෙන් මේවා ඡායාරූප පිටපත් ලෙස හෝ ගෙන මෙරටට ලබා ගැනීමට සාර්ථක වැඩ පිළිවෙලක් අරඹා නැත.

මේවා ජාතික පුස්තකාලයකට හොඳ සම්පත්ය. ජාතික පුස්තකාලය මගින් මෙම වැඩ පිළිවෙල ක වදා හෝ අරඹනු ඇතැයි සිතිය හැකිය.

<u>සංස්කෘතික සංකල්පය :</u>

ජාතික පුස්තකාලය පිළිබඳ අදහස අද අළුත් දෙයක් නොවේ. එය බොහෝ රටවල ව්‍යාප්තව පවත්නා සංස්කෘතික සංකල්පයකි. ජාතික පුස්තකාලයක් දියුණු රටවල මෙන්ම, දියුණු වන රටවලද පිහිටුවා තිබේ. මහා බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, ප්‍රංශය වැනි රටවල ජාතික පුස්තකාලය පිළිබඳ අදහස සංවර්ධනය වෙමින් පැවතියකි.

අද තිබෙන බ්‍රිතාන්‍ය පුස්තකාලය ආරම්භයේ සිට ජාතික පුස්තකාලයක ලක්ෂණයන්ගෙන් යුක්තව සංවර්ධනය වූවකි. අපරදිග රටවල් වූ මහා බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, පෘතුගාලය, ඕලන්දය වැනි රටවලද, පෙරදිග රටවල් වූ ජපානය, සිංගප්පූරුව, ඉන්දියාව වැනි රටවලද ජාතික පුස්තකාල පිහිටුවා තිබේ.

අප්‍රිකා මහා ද්වීපයේ පිහිටි සංවර්ධනය වෙමින් පවතින තයිපීරියාව හා මොසැම්බික් යන රාජ්‍යයන්හි ජාතික පුස්තකාල පිහිටුවා තිබීම අනාගතය පිළිබඳ හොඳ පෙර නිමිත්තය. ජාතික පුස්තකාල පිළිබඳව වූ වැදගත්කම අද ලොව සෑම ශිෂ්ඨ රාජ්‍යයක් විසින්ම පිළිගෙන ඇත.

දැනට ජාතික පුස්තකාල නොපිහිටුවා ඇති රාජ්‍යයන් ඒවා පිහිටුවීමට උත්සාහ ගනී. ශ්‍රී ලංකාවද මේ අතරට එක්වීම ආඩම්බරයෙන් සිහිපත් කළ යුතුවේ. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ කතාව මෑත ඉතිහාසය හා සම්බන්ධය. මෑත අවදියේ විසූ ලාංකික උගතුන් විසින් වරින් වර ජාතික පුස්තකාලයක අවශ්‍යතාව ගැන අදහස් පළ කරන ලදී.

ඉතිහාසය :

ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය පිළිබඳ සංකල්පයේ මහි මාත්‍රයක් වශයෙන් හැඳින්විය හැකියි, 1870 දී කොළඹ පිහිටුවන ලද ප්‍රාචීන පුස්තකාලය. මෙම පුස්තකාලයේ ප්‍රධාන පරමාර්ථයන් වූයේ පෙරදිග භාෂාවන්ගෙන් ලියැවුණු පොතපත විශේෂයෙන්, ලංකාව හා සම්බන්ධ පොතපත

-ආරක්ෂා කොට පවත්වාගෙන යාමයි. මෙම අදහසේම වැඩි වර්ධනයක් ලෙස 1877 දී අරඹන ලද ජාතික කෞතුකාගාර පුස්තකාලය හැඳින්විය හැකිය. ප්‍රාචීන පුස්තකාලයද 1877 දී මෙම පුස්තකාලයට ඒකාබද්ධ කරන ලදී.

ජාතික පුස්තකාලයක් බිහි කිරීමේ පරමාර්ථ මේ පුස්තකාලවල එක එල්ලේ නොතිබුණද, ජාතික පුස්තකාලයක මුල් බීජ ලක්ෂණ මේවා තුළ තිබුණ බව සිතිය හැකිය. තිබුණු පොතපත ආරක්ෂා කර ගැනීමටත්, නැතිවීමට ඉඩකඩ තිබූ වටිනා පොත් රාශියක් ආරක්ෂා කර ගැනීමටත් මෙකී පුස්තකාලවලට හැකි විය.

<u>පණතක් :</u>

1885 අංක: 1 දරන මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥා පණත මගින් දිවයිනේ ප්‍රකාශයට පත් කරනු ලබන සෑම පොතපතකින්ම පිටපත් හතරක් රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත එවීමට නියම කරන ලදී. මෙයින් එක් පිටපතක් අනිවාර්යයෙන් කෞතුකාගාර පුස්තකාලයේ තැන්පත් කළ යුතු විය. මෙය දිවයිනේ පළවන සියළුම පොත් ඒකරාශී කිරීමට ගන්නා ලද ප්‍රථම පියවර වශයෙන් හැඳින්විය හැකිය. ජාතික පුස්තකාල සංකල්පයේ තවත් පියවරක් මෙන්ම, ජාතික පුස්තකාල පොත් එකතුවක හොඳ තෝපැන්නක් ලෙසද මෙම කාර්යය හැඳින්විය හැකිවේ.

කමිටු නිර්දේශ :

විසිවන සියවස ආරම්භයේ සිටම මෙරට ජාතික පුස්තකාලයක් පිහිටුවීමේ වැදගත්කම පිළිබඳව සමිති, සමාගම් හා උගත් පුද්ගලයින් විසින් කරුණු ඉදිරිපත් කොට තිබිණි. 1948 වර්ෂයේදී මෙරටට නිදහස ලැබීමෙන් පසු මෙම ඉල්ලීම වැඩි වශයෙන්ම දක්නට ලැබිණ. පුරා වස්තු සම්බන්ධ විශේෂ කමිටුවේ අවසාන වාර්තාව (1959) මගින්ද ජාතික පුස්තකාලයක වැදගත්කම පෙන්වා දී තිබුණ බව දැකිය හැකිය. මෙම කමිටුවට අයත් කාර්යයක් නොවුවද, ඒ පිළිබඳ අදහස් දක්වා ඇත්තේ සංස්කෘතික වැදගත්කම නිසාමය.

තවදුරටත් ජාතික පුස්තකාලය ගැන සඳහන් කරමින් " ජාතික පුස්තකාල සේවයක ආරම්භය ලෙස කෞතුකාගාර පුස්තකාලය, ජාතික පුස්තකාලයක් බවට පත් කළ යුතු වන්නේය"යි කියයි. මේ හැර ජාතික පුස්තකාලයේ ව්‍යුහය ගැන එම කමිටුව විස්තර කොට ඇත.

කොළඹ මහජන පුස්තකාලය පිළිබඳව පත් කරන ලද කොමිසමේ සභාපතිවරයා වූ පී.කන්දයියා මහතා ජාතික පුස්තකාලයක වැදගත්කම හා අවශ්‍යතාවය ගැන කමිටු වාර්තාවේ මෙසේ සඳහන් කොට තිබිණි:

" ජනතාවගේ සංස්කෘතික ජීවිතය වර්ධනය කිරීමට ජාතික පුස්තකාලය උසස් මෙහෙයක් ඉටු කරනු ඇත්තේය..."

විල්මට් ඒ. පෙරේරා මහතාගේ සභාපතිත්වයෙන් යුත් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමේදීද (1961) ජාතික පුස්තකාලයක අවශ්‍යතාවය ගැන අවධානය යොමු කොට, කටයුතු කාර්යයන් ගැනද හැඳින්වීමට උත්සාහ ගත් බව පෙනේ.

1960 වර්ෂයේදී පිහිටුවන ලද ලංකා පුස්තකාල සංගමය මගින් වරින් වර නොයෙකුත් යෝජනා ජාතික පුස්තකාලය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලදී. ජාතික පුස්තකාලය පිළිබඳ අදහස මෙරට ප්‍රචලිත කිරීම පිණිස පුස්තකාල සංගමය මගින් විශාල මෙහෙයක් ඉටු කරන ලද බව සිහිපත් කළ යුතුවේ.

1961 දී ලංකාවට පැමිණි යුනෙස්කෝ විශේෂඥ හැරල්ඩ් වී. බොනී මහතා ලංකාවට සුදුසු පුස්තකාල යන මැයෙන් නිබන්ධයක් පිළියෙල කොට තිබිණි. එහි ජාතික පුස්තකාලයක වැදගත්කමත්, අවශ්‍යතාවත් ඔහු විසින් මැනවින් පෙන්වා දෙන ලදී.

1967 දී ආසියාවේ පුස්තකාල සේවාවන්තේ ක්‍රම සම්පාදනය යනුවෙන් විශේෂඥයන්ගේ රැස්වීමක් කොළඹදී පැවැත්විනි. එහිදී ලංකාවේ පුස්තකාල සේවා සහ ප්‍රලේඛන සේවා දියුණු කිරීම පිළිබඳ සැලැස්මක්ද පිළියෙල කරන ලදී. මෙම සැලැස්මෙහි පුස්තකාල සේවා දියුණු කිරීම සඳහා රජයේ ආයතනයක් පිහිටුවීමේ වැදගත්කම පෙන්වා දී තිබුණි.

ජාතික පුස්තකාල සේවා මණ්ඩල පණත :

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1970 වර්ෂයේ මුල් කාලය තුළදී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පණත ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව සම්මත විය. ඒ අනුව 1970 අංක: 17 දරන පණතින් සංස්ථාපිතව ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සිය කටයුතු නිල වශයෙන් ආරම්භ කරන ලදි.

ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් වන්නේ ශ්‍රී ලංකා ජාතික මහා පුස්තකාලය පිහිටුවීම සහ එය පවත්වාගෙන යාමයි. මේ නිසා ජාතික පුස්තකාලය පිහිටුවීමේ කාර්යය සැබෑ වන සිහිනයක් බවට පත් විය.

වෙනස :

ජාතික පුස්තකාලයක කාර්ය භාරය ජාතික කෞතුකාගාර පුස්තකාලයක හෝ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවක කාර්යයන්ට වඩා හාත්පසින්ම වෙනස්ය. මේවායේ පුළුල් හෝ පැතිරී ගිය සේවයක් දක්නට නොමැත. කෞතුකාගාර පුස්තකාලය මගින් මුද්‍රිත හෝ අමුද්‍රිත සියළුම ලිඛිත සාහිත්‍යය එක් රැස් කර ගැනීමට වෑයමක් නොදරන්නේ එහි ප්‍රධාන පරමාර්ථය එය නොවන නිසාය.

## National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/11/01
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.D.R. Gamage

Signature : ...

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : Irom

Date : 2017/11/01

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*